# COVID 19 වසංගත කාලයේදී ඔබගේ සෞඛ්‍ය සහ රැකියාව

සම්බන්ධයෙන් වැදගත් වන මූලික තොරතුරු

## සේවකයෙකු හට උණ හෝ වෙනත් රෝග ලක්ෂණ ඇත්නම් ඔහු හෝ ඇය කුමක් කල යුතුද?

කිසියම් සේවකයෙකු හට කැස්ස, උණ හෝ හුස්ම ගැනීමේ අපහසුතා වැනි රෝග ලක්ෂණ පවතී නම් ඔහු හෝ ඇය අනෙක් පුද්ගලයන්ගෙන් වෙන් වී සිටිය යුතු අතර ඉතා ඉක්මනින් කටාර්හි COVID-19 හදිසි ඇමතුම් අංකය වන **16000** ඇමතිය යුතුය.

හදිසි තත්වයකදී **990** අංකය අමතා ගිලන් රථයක් ඉල්ලා ගත යුතුය.

## සේවකයෙකු හට සෞඛ්‍ය කාඩ්පතක් නොමැති නම් ඔහු හෝ ඇය කුමක් කළ යුතුද?

වර්තමාන අර්බුදකාරී තත්වය තුළ රෝග පරීක්ෂා කිරීමට සහ / හෝ ප්‍රතිකාර ලබා ගැනීමට සෞඛ්‍ය කාඩ්පතක් සහ / හෝ QID ළඟ තබා ගැනීම අවශ්‍ය නොවේ. මෙම සේවාවන් රජය විසින් නොමිලේ සපයනු ලැබේ.

## සේවකයෙකු ස්වයං හුදකලා වීමකට යා යුත්තේ කුමන අවස්ථාවකදී ද?

පහත සඳහන් අවස්ථා වලදී සේවකයෙකු ස්වයං හුදකලා විය යුතු අතර COVID-19 හදිසි ඇමතුම් අංකය වන **16000** ඇමතිය යුතුය.

- කැස්ස, උණ හෝ හුස්ම ගැනීමේ අපහසුතා වැනි COVID-19 හි කිසියම් රෝග ලක්ෂණයක් පෙන්වන විට
- ඔබ යම්කිසි පුද්ගලයෙකු සමඟ සම්බන්ධතා පවත්වන අවස්ථාවේදී එම පුද්ගලයා රෝග ලක්ෂණ නොපෙන්වුවත් පසුව ඔහුට හෝ ඇයට COVID-19ඇති බවට පරීක්ෂා කර තහවුරු වූ විට
- රෝගය පුළුල් ලෙස පැතිරී ඇති ඕනෑම රටක සිට මෑතකදී ආපසු පැමිණි අය

වැඩි විස්තර සඳහා කරුණාකර මහජන සෞඛ්‍ය අමාත්‍යාංශයේ වෙබ් අඩවිය වන www.moph.gov.qa/ වෙත පිවිසෙන්න.

## සේවකයන්ව හුදකලා කිරීමකට ලක් කරන්නේ කුමන අවස්ථාවන්හීද?

COVID-19 ඇති බවට සැක කරනු ලබන සේවකයෙකුගේ පරීක්ෂණ වාර්තා ලැබෙන තුරු රජයේ වගකිව යුතු බලධාරීන් විසින් ඔහු හෝ ඇය හුදකලා ස්ථානයක රඳවා තබනු ඇත (ඔවුන් රෝග ලක්ෂණ පෙන්වන විටදී හෝ COVID-19 ඇති බවට තහවුරු වූ පුද්ගලයෙකු සමඟ සම්බන්ධතා පැවති විට).

## සේවකයෙකු හට COVID-19 වැළඳී ඇති බවට තහවුරු වූ විට කුමක් සිදු වේද?

COVID-19 වැළඳී ඇති බවට තහවුරු වූ සේවකයෙකු මුකයිනිස් (Mukainis) හි ඇති නිරෝධායන මධ්‍යස්ථානයේ රඳවා තබන අතර අවශ්‍ය සියලුම වෛද්‍ය පහසුකම්, ආහාර පාන සහ නවාතැන් නොමිලේ ලබා දෙනු ලැබේ.

## හවුල් නිවාසයක වෙසෙන සේවකයන් හුදකලා කිරීම හෝ නිරෝධායනය කිරීම සඳහා වගකිව යුත්තේ කවුද?

මහජන සෞඛ්‍ය අමාත්‍යාංශය යටතේ පවතින අර්බුද කළමනාකරණය සඳහා වන උත්තරීතර කමිටුවේ අධීක්ෂණය යටතේ සේවය කරන විශේෂිත වෛද්‍ය කණ්ඩායමක් සේවකයින්ගේ හුදකලාව සහ නිරෝධායනය සඳහා කටයුතු කිරීමේ වගකීම දරයි. හුදකලා වීම හෝ නිරෝධායනය වීම සඳහා අවශ්‍ය කටයුතු පිළියෙළ කිරීම සඳහා සේවායෝජකයා වගකිව යුතු නොවේ.

## වලංගු QID නොමැති සේවකයන් හට ද අවශ්‍ය විටකදී ප්‍රතිකාර ලබා ගත හැකිවේද?

සියලුම සේවකයින්ට අවශ්‍ය සියලුම ප්‍රතිකාර නොමිලේ ලැබෙනු ඇති අතර ඒ සඳහා ඔවුන්ගේ තත්වය අදාළ නොවේ.

## හුදෙකලා වන, නිරෝධායනය වන හෝ ප්‍රතිකාර ලබන අතරතුර සේවකයන්ට වැටුප් ගෙවනු ලැබේද?

අසනීප නිවාඩු සඳහා වූ දීමනා සඳහා සුදුසුකම් ලබන්නේද නැද්ද යන්න නොසලකා හුදකලා වන, නිරෝධායනය වන හෝ ප්‍රතිකාර ලබන සියලුම සේවකයින් හට ඔවුන්ගේ මූලික වැටුප සහ දීමනා ලැබෙනු ඇත.

## සේවා නතර කරන ලෙස රජය දුන් උපදෙස් පිළිපැද ඇති අංශවල සේවය කරන සේවකයන් හට ඔවුන්ගේ මූලික වැටුප සහ ආහාර පාන, නවාතැන් වැනි වෙනත් දීමනා තවදුරටත් ලැබේද?

ඔව්. සියලුම සේවකයන් හට ඔවුන්ගේ සේවායෝජකයා මඟින් තවදුරටත් මූලික වැටුප සහ දීමනා ලැබිය යුතුය

## මෙම පවතින අර්බුදය හේතුවෙන් සේවකයන්ගේ කොන්ත්‍රාත්තු අවලංගු විය හැකිද?

කොන්ත්‍රාත්තු අවලංගු කිරීම සඳහා අයිතිය සේවායෝජකයන් සතු වේ. කෙසේ වෙතත්, සේවා කාලය අවසන් කිරීම කම්කරු නීතියේ සහ කොන්ත්‍රාත්තුවේ නියමයන්ට අනුකූලව සිදු කළ යුතු අතර, ඒ සඳහා නියමිත දැනුම් දීමේ කාලසීමාව සහ නැවත තම රටට යෑමට අවශ්‍ය ගුවන් ටිකට් පත ද අඩංගු වන අපේක්ෂිත සියලුම හිමිකම් ගෙවීම් ද ඇතුලත් වේ.

## තමන්ට වැඩ කිරීමට නොහැකි වූ කාල සීමාව ආවරණය කිරීමට හෝ සමාගම විසින් අඩු සේවා සැපයීමක් ලබා දීම හේතුවෙන් එම කාල සීමාව සඳහා වාර්ෂික නිවාඩු භාවිතා කරන ලෙස හෝ වැටුප් නොගෙවූ නිවාඩු ලබා ගන්නා ලෙස සේවකයන්ගෙන් ඉල්ලීම් කළ හැකිද?

දීර්ඝකාලීනව ව්‍යාපාරයේ සහ රැකියාවේ පැවැත්ම සැලකිල්ලට ගනිමින් දෙපාර්ශවයේම යහපත සඳහා හානිය අවම වන අන්දමින් සියලු දෙනා සහයෝගයෙන් කටයුතු කිරීම මෙම කාල පරිච්ඡේදය තුළ දී වැදගත් වේ. එම නිසා, ව්‍යාපාරය නවතා දමා හෝ සේවකයාට කිසිදු වැඩක් පවරා නොමැති නම් සේවකයන් ඔවුන්ගේ වැටුප් රහිත නිවාඩු ලබා ගැනීම හෝ වාර්ෂික නිවාඩු භාවිතා කිරීම පිළිබඳව සේවායෝජකයන් හා සේවකයන් අන්‍යෝන්‍ය එකඟතාවයකින් කටයුතු කළ හැකිය. කෙසේ වෙතත්, සේවායෝජකයින් විසින් නවාතැන් සහ ආහාර ඇතුළු අනෙකුත් සියලුම ප්‍රතිලාභ අඛණ්ඩව ලබා දිය යුතුය.

## සේවකයන් රටින් බැහැරව නැවත පැමිණීමට නොහැකි තත්වයක සිටිනවා නම් එය ඔවුන්ගේ සේවය සඳහා බලපානු ලබන්නේ කෙසේද?

මෙහිදී සේවායෝජකයා සහ සේවකයා එම සේවා කොන්දේසි සහ ප්‍රතිලාභ පිළිබඳව සාකච්ඡා කළ යුතු වේ. කොන්ත්‍රාත්තුවේ සිදු කරන ඕනෑම වෙනස් කිරිමක් ප්‍රතික්ෂේප කිරීමට සේවකයාට හැකියාව ඇත. සේවය අත්හිටුවන අවස්ථාවකදී එය කම්කරු නීතියේ සහ කොන්ත්‍රාත්තුවේ නියමයන්ට අනුකූලව සිදු කළ යුතු අතර, ඒ සඳහා නියමිත දැනුම් දීමේ කාලසීමාව සහ අපේක්ෂිත සියලුම හිමිකම් ගෙවීම් ද ඇතුලත් වේ.

## රාජ්‍ය සේවා අවම කර ඇති මෙම කාලය තුළ වීසා සහ QID කල් ඉකුත් වුවහොත් ඒවා ස්වයංක්‍රීයව දීර්ඝ කරනු ලැබේ ද?

වීසා දීර්ඝ කර ගැනීම සඳහා (හෝ එහි තත්ත්වය පරික්ෂා කිරීම සඳහා) මෙම සබැඳිය භාවිතා කරන්න. https://portal.moi.gov.qa/visitvisaextension

QID දීර්ඝ කිරීම සඳහා (හෝ එහි තත්ත්වය පරික්ෂා කිරීම සඳහා) කරුණාකර **Metrash2** app භාවිතා කරන්න.

යාවත්කාලීන තොරතුරු සඳහා කරුණාකර අභ්‍යන්තර කටයුතු අමාත්‍යාංශයේ වෙබ් අඩවිය වෙත යොමු වන්න.

## නිවෙස් වල සේවය කරන ගෘහ සේවිකාවන් සඳහාත් මෙම කොන්දේසි අදාළ වේද?

ඉහත තොරතුරු සියල්ලම නිවාසවල සේවය කරන ගෘහ සේවිකාවන්ට ද සමානව අදාළ වේ.

## මෙම කාලය තුළ සේවකයන් හට ඔවුන්ගේ රැකියාව හෝ නවාතැන් පිළිබඳව පැමිණිල්ලක් හෝ ගැටලුවක් තිබේ නම් ඔවුන් කුමක් කළ යුතුද?

සේවකයන් විසින් **16008** අංකය හරහා හෝ info@adlsa.gov.qa හරහා පරිපාලන සංවර්ධන, කම්කරු සහ සමාජ කටයුතු අමාත්‍යංශය සම්බන්ධ කර ගත යුතුය.